# 37

# කච්චායන, මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායයන්ගේ සංස්කෘත ආභාසය හා පාලි සද්දනීති ව්‍යාකරණයේ ස්වාධීනත්වය

දිවුලපිටිය බලගල්ලේ සරස්වතී මහපිරුවන්පති
පූජ්‍ය පහලගම ධම්මික මහා ස්ථවිර

ලක්දිව විද්‍යමාන පාලි ව්‍යාකරණ ග්‍රන්ථ අතර සාම්ප්‍රදායික ව්‍යාකරණ ලෙස කච්චායන හා මොග්ගල්ලායන යන ව්‍යාකරණ හැඳින්විය හැකිය. මෙයින් ඉපැරණි ව්‍යාකරණය ලෙස සලකන්නේ කච්චායන ව්‍යාකරණයයි. මොග්ගල්ලායන ව්‍යාකරණය ග්‍රන්ථය ඉන් අනතුරු ව රචනා කොට තිබේ. මෙම ව්‍යාකරණ සම්ප්‍රදායයන් දෙක සංස්කෘත ව්‍යාකරණ රීතිය බෙහෙවින් ආශ්‍රය කොට තිබේ. මහාවිහාරීය භික්ෂූන් පෙළ හා අට්ඨකථා ආශ්‍රයෙන් පාලි භාෂාවට ප්‍රමුඛස්ථානය හිමිකරමින් ක්‍රියා කළ බව පෙනීයයි. ඊට විරුද්ධ අභයගිරිවාසීන් සංස්කෘත භාෂාව ස්වකීය මාධ්‍යය කරගනිමින් ධර්මදේශනා කිරීමත්, ග්‍රන්ථ රචනයත්, සිදුකිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් ලක්දිව රචිත ව්‍යාකරණයන් සඳහා සංස්කෘත ආභාසය ලැබුණු බව පෙනේ. පෙරදිග ඉතිහාසයේ අංගසම්පූර්ණ ව්‍යාකරණය වශයෙන් පාණිනි ව්‍යාකරණය හැඳින්වීමට පුලුවනි. එය රචනා කිරීමෙන් අනතුරු ව පශ්චාත්කාලීන ව්‍යාකරණ සඳහා එය බෙහෙවින් බලපා තිබේ. සංස්කෘත ව්‍යාකරණ ප්‍රත්‍යාහාර ක්‍රමයට අක්ෂර මාලාව, සංඥා, සන්ධි ආදී භාෂා සංඝටක කෙරේ බලපාන අයුරින් ස්වකීය ව්‍යාකරණ සකස්කොට තිබේ. භාෂාව වශයෙන් බලනවිට ප්‍රාකෘත භාෂා ගණයට අයත් වන පාලි භාෂාව හා සංස්කෘත යන භාෂා දෙකේ අනන්‍යතාව සුරකෙන ආකාරයට වර්ණ මාලාව සකසා තිබේ. භාෂා දෙක ම ආගමික භාෂාය. එම නිසා සාහිත්‍යය වශයෙන් සුවිසල් වෙයි. භාෂා දෙකේම උත්පත්තිය භාරතීය දේශයයි. මෙම සාම්‍යයන් හේතු කොටගෙන සංස්කෘත ව්‍යාකරණ ගුරු කොට ගනිමින් පාලි කච්චායන හා

මොග්ගල්ලායන යන ව්‍යාකරණ රචනා කොට ඇත. එහි දී පාණිනි විසින් රචිත අෂ්ඨධ්‍යායී ව්‍යාකරණය හා සර්වවර්මන් හෙවත් දුර්ගසිංහ ආචාර්යවරයා විසින් රචිත කාතන්ත්‍ර ව්‍යාකරණය යන ව්‍යාකරණ ග්‍රන්ථ දෙක කච්චායන ව්‍යාකරණය සඳහා ඍජු ලෙස ගුරුකොට ගෙන තිබේ. මොග්ගල්ලායන ව්‍යාකරණය සඳහා චන්ද්‍ර ආචාර්යයන් විසින් රචිත චාන්ද්‍ර ව්‍යාකරණය ගුරුකොට ගෙන තිබේ. සංස්කෘත හා පාලි ව්‍යාකරණ ග්‍රන්ථ තුලනාත්මක ව අධ්‍යයනය කිරීමෙන් මෙකී සංස්කෘත ව්‍යාකරණ ආභාසය පාලි ව්‍යාකරණ සඳහා බලපා තිබෙන ආකාරය දක්නට ලැබේ.

### මොග්ගල්ලායන ව්‍යාකරණය චාන්ද්‍ර ව්‍යාකරණය ගුරුකොට ගැනීම

චාන්ද්‍ර ව්‍යාකරණයේ කර්තෘ චාන්ද්‍ර ආචාර්යවරයා ය. මොහු චන්ද්‍ර, රාමචන්ද්‍ර, චන්ද්‍රාචාර්ය, චන්ද්‍රගොමී යන අන්‍ය නාමයන් කෙරෙන් හඳුන්වයි. ගෝමී යන්න ගෞරවාර්ථ හා පූජ්‍යාර්ථයේ යෙදෙන බව ගුරුළුගෝමී හා සඳගෝමී යන නම් වලින් ස්ඵුට වෙයි. මෙකී ගෝමී යන්න බෞද්ධ මහා උපාසකයන් සඳහා ව්‍යාවෘත නාමයක් බව ත්‍රිකාණ්ඩශේෂ නම් අභිධාන කෝෂ කථනයේ දී "මහෝපාසක ගොමිනෞ" යන්නෙන් ඒ බව කියවේ. කෙසේ වෙතත් චාන්ද්‍ර ආචාර්යයන් බෞද්ධයකු වශයෙන් නිගමනය කළ හැකි ය. ඒ බවට චාන්ද්‍ර ව්‍යාකරණයේ ආරම්භක පද්‍ය සාක්ෂ්‍ය දරයි. එකී පද්‍යයේ එන සිද්ධම්, සර්වඥම්, සර්වවීයම් හා ජගතොගුරුම් යන විශේෂණ පද චතුෂ්කයෙන් තමා බෞද්ධ භක්තිමතෙක් ලෙස ප්‍රණාම කරයි. චාන්ද්‍ර ව්‍යාකරණය සියලු ව්‍යාකරණ අංගයන්ගෙන් යුත්ත ව සංග්‍රහ කොට තිබේ.

01, සූත්‍ර
02. උණාදී
03. ධාතුපාඨ

වශයෙන් ග්‍රන්ථය කොටස්ත්‍රයකින් ද ආධ්‍යාය හතකින් ද පාද විසිහතකින් ද සූත්‍ර 3426 උපයුක්ත කරමින් ව්‍යාකරණය සකසා තිබේ. මේ ව්‍යාකරණය සඳහා පරිවාර ග්‍රන්ථ ඇත්තේ අල්ප ප්‍රමාණයකි. චාන්ද්‍රාචාර්යන් විසින් ද ස්වකීය ව්‍යාකරණය සඳහා රත්නමතිපඤ්ජිකා නමින් ටීකාවක් රචනා කොට තිබේ. චාන්ද්‍ර ව්‍යාකරණය ඉපැරණි බවත් කාතන්ත්‍ර ව්‍යාකරණයට පූර්ව යුගයේ රචනා කරන්නට ඇති බවත් උගත්තු පිළිගනිති[1] චාන්ද්‍රව්‍යාකරණය දෙස බලා මොග්ගල්ලායන ව්‍යාකරණය රචනා කොට තිබේ. මොග්ගල්ලායන තෙරුන් චාන්ද්‍ර කෙරේ ඉමහත් භක්තිවන්ත ව කටයුතු සිදුකර තිබෙන බව පෙනීයයි. ඊට හේතුව චාන්ද්‍ර ආචාර්යයන්

බෞද්ධයකු වීම යයි සිතීමට පුළුවනි. කෙසේ වෙතත් මොග්ගල්ලායන ව්‍යාකරණය රචනයේ දී චාන්ද්‍රව්‍යාකරණය ඔස්සේ ගමන් කළ බව පැහැදිලි ය. එය,

- ආරම්භක පද්‍ය
- වර්ණ මාලාව
- සූත්‍ර
- වෘත්ති

චාන්ද්‍රව්‍යාකරණයේ ප්‍රණාම පද්‍ය දෙස බලා මොග්ගල්ලාන ආචාර්යයන් මොග්ගල්ලායන ව්‍යාකරණයේ දී පාලියට පරිවර්තනය කර තිබෙන බව දක්නට ලැබේ.

"සිද්ධම් ප්‍රණම්‍ය සර්වඥ - සර්වීය ජගතො ගුරුඃ,
ලඝුවිශ්ප්‍රෂ්ට සම්පූර්ණ - මුච්‍යතේ ශබ්ද ලක්ෂණම්"[2]
(චාන්ද්‍රව්‍යාකරණ)

"සිද්ධමිද්ධ ගුණා සාධු - නමස්සිත්වා තථාගතං,
සද්ධම්ම සංසං භාසිස්සං - මාගධං සද්ද ලක්ඛණං"[3]
(මොග්ගල්ලායන ව්‍යාකරණ)

මෙම ප්‍රාරම්භක පද්‍යයන් දෙක දෙස බැලීමෙන් පෙනී යන්නේ පද්‍ය සඳහා භාවිත ශබ්ද මෙන් ම පද සමාන බවයි. එසේ ම වෘත්තය ද සමාන ය. ප්‍රථ්‍යාවක්ත්‍ර වෘත්තය දෙකේ දී ම භාවිත කොට තිබේ. යමකට ප්‍රපඤ්ච නො වී, පවසතහොත් චාන්ද්‍රව්‍යාකරණයේ ප්‍රණාම පද්‍ය පාලියට නගා තිබෙන බව දක්නට ලැබේ. ඉන් අනතුරු වර්ණ මාලාව දක්වයි. මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදාය වර්ණ මාලාව සඳහා අක්ෂර 41 නිර්දේශ කරයි. (තෙතාළිසාවණ්ණක්ඛරා) ඒ හා ඕ යන දීර්ඝාක්ෂර දෙක මොග්ගල්ලායනයේ දී සංස්කෘත වර්ණ මාලාවෙන් ගෙන තිබේ. සූත්‍ර රචනයේ දී බොහෝ සෙයින් මොග්ගල්ලායන හිමියන් චාන්ද්‍ර සූත්‍ර පාලියට නගා තිබේ. ඒ බව,

| චාන්ද්‍ර සූත්‍ර | මොග්ගල්ලායන සුත්ත |
|---|---|
| "විධිර්වවිශේෂණාන්තස්‍ය[4] | විධිබ්බිසෙසණනන්තස්ස[5] |
| ප්‍රතිපතිශේධෙ[6] | විප්පටිසේධේ[7] |
| සප්තම්‍යං පූර්වශ්‍ය[8] | සත්තමියං පුබ්බස්ස[9] |
| පඤ්චමියං පරස්‍ය[10] | පඤ්චමිං පරස්ස[11] |
| ෂෂ්ටයාන්තස්‍ය[12] | ඡට්ඨීයන්තස්ස[13] |
| සමෝ වා[14] | තාය වා"[15] |

සූත්‍ර චාන්ද්‍රව්‍යාකරණයෙන් මොග්ගල්ලායනයට නගාගෙන තිබෙන ආකාරය මෙයින් දක්නට ලැබේ. මොග්ගල්ලායන තෙරුන් සූත්‍ර පමණක් නො ව, වෘත්ති රචනයේ දී චාන්ද්‍රව්‍යාකරණයේ තිබෙන වෘත්ති පාලියට නගා තිබෙන ආකාරය දක්නට ඇත.

"ද්වයෝඃ සාවකාශායෝරේකත්‍ර ප්‍රසංගේ යත් පරං තද් භවති"[16]
"ද්වින්නං සාවකාසානමෙකත්ථප්පසංගේ පරෝ හෝති"[17]
"සත්තමීනිර්දේශේ පූර්වස්‍යෛව කාර්යං වේදිතව්‍යාම් ඉකෝ යන් අචිදග්න්‍යුදකාම් සමිදත්‍රෙති කස්මාත් න භවති අචිත්‍යෛපශලේසික ආධාරඃ තත්‍රෛතාවදුච්‍යතේ පූර්වස්‍යෛව භවති න පරස්‍යේති"[18]
"සත්තමීනිද්දේසෙ පුබ්බස්සේව කාරියං ඤාතබ්බංවේලග්ගං තමහන්ති කස්මා න හෝති සරේතොපසිලේසිකධාරෝ තත්ථෛතාව පුබ්බස්සේව හෝති න පරස්සාති"[19]
"පඤ්චමීනිර්දේශේ පරස්‍යෛව කාර්යං වේදිතව්‍යාම් අතෝ හිස එෂ් වෘක්ෂඃ ඉහ න භවති මාලාභිරත්‍ර ඉහ කස්මාත් න භවති දූෂද්දිරිති අනන්තරේ තෘතාර්ථත්වාන්න ව්‍යාහිතස්‍ය කාර්යම්"[20]
"පඤ්චමීනිද්දේසෙ පරස්සේව කාරියං ඤාතබ්බං නරා නරේ ඉධ න හෝති ජන්තුයෝ අනන්තා ඉධ කස්මා න හෝති ඔසධ්‍යා අන්තරේ කත්ථතාය න ව්‍යවහිතස්ස කාරියං"[21]

සංස්කෘත ව්‍යාකරණ ගුරුකොටගත් අයුරු ප්‍රණාම පද්‍ය හා සූත්‍ර වෘත්තිවලින් මැනවින් පෙන්නුම් කරයි. පාණිනි ව්‍යාකරණය හෙවත් අෂ්ඨාධ්‍යායී ව්‍යාකරණය ද කච්චායනය රචනයේ දී ගුරු කොට ගෙන තිබෙන බව පාණිනී ව්‍යාකරණයේ හා කච්චායන ව්‍යාකරණයේ සූත්‍ර සංසන්දනය කොට බැලීමෙන් ප්‍රකට වෙයි.

### ● කච්චායන ව්‍යාකරණය කාතන්ත්‍ර ව්‍යාකරණය ගුරුකොට ගැනීම

පළමු වන සියවසේ දී පමණ බෙහෙවින් ජනප්‍රිය වූ ව්‍යාකරණයක් වශයෙන් කාතන්ත්‍ර ව්‍යාකරණය හැඳින්වීමට පුළුවනි. කාතන්ත්‍රයේ කර්තෘ වන්නේ සර්වවර්මන් නම් වෛයාකරණඥයා ය. කාතන්ත්‍රය රචනා කෙළේ රාජ කුමාරයන්ට පහසුවෙන් ව්‍යාකරණ ඉගෙන ගැනීමට ය. කාතන්ත්‍ර යන්නෙන් සම්පෘක්ත වන්නේ කුඩා ව්‍යාකරණය යන්නයි. කු යන අව්‍යපදය

යෙදී ඇත්තේ අල්පාර්ථයේ ය. මෙයට කෞමාර ව්‍යාකරණ, දුර්ගසිංහ වෘත්ති හා කලාප යන පර්යාය වශයෙන්ද භාවිත කරයි. රචකයා නම් දෙකකින් හඳුන්වයි. එනම්, සර්වවර්මන් හා දුර්ගසිංහ යන නම් දෙකයි. මෙම කාතන්ත්‍ර ව්‍යාකරණය රචනා කොට වික්‍රමාදිත්‍ය රජුට දක්වීමෙන් චිත්තසංන්තුෂ්ටි ප්‍රාප්ත වික්‍රමාදිත්‍ය රජු විසින් දුර්ගසිංහ දෙවියන්ට සමාන වන බවත් දෙව් බවට පත්වන බව පවසමින් අමර යන උපාධි නාමය ප්‍රදානය කොට තිබේ. ඒ නිසා දුර්ගසිංහාචාර්යයන් අමර, අමරසිංහ, දුර්ග, දුර්ගාචාර්ය, සිංහ හා දේව යන පර්යාය ප්‍රාප්ත විය. එසේ ම සර්වවර්මන් යන නාමයෙන් දුර්ගසිංහයන් ම හඳුන්වන බව *"දුර්ගදාස විද්‍යාවාගීශ"*[22] යන්නෙන් දක්නට ලැබේ. කාතන්ත්‍ර සන්ධි වෘත්තියේ එන මෙම පද්‍ය තුළින් ද නාමය පිළිබඳ යම් නිගමනයකට පත්වීමට පුළුවනි.

> *"දේවදෙවං ප්‍රණම්‍යාදෞ - සර්වඥං සර්වදර්ශිනම්,*
> *කාතන්ත්‍රස්‍ය ප්‍රවක්ෂ්‍යාමි - ව්‍යාඛ්‍යානං ශාර්වවර්මකම්"*[23]

කාතන්ත්‍ර කර්තෘවර දුර්ගසිංහාචාර්ය හා සර්වවර්මන් යන නම් දෙකෙන් ම එක ම පුද්ගලයකු ව්‍යාවෘත වෙයි. අමර යන උපාධි නාමයෙන් ම අමරකෝෂ යන අභිධාන ග්‍රන්ථය නම් කොට තිබීම තුළින් මොහුගේ නම් තුළ දක්නට ලැබෙන සාම්‍යය ප්‍රකට වෙයි. ව්‍යාකරණ ග්‍රන්ථයක් වශයෙන් කාතන්ත්‍රය,

01. සන්ධි 02. නාම 03. ආඛ්‍යාත 04. කෘත්

වශයෙන් ආධ්‍යාය හතරකින් හා පද විසිපහක් ද සූත්‍ර 1402 ක් ද අන්තර්ගත වෙයි. මෙහි පරිවාර ග්‍රන්ථ ලුප්තප්‍රාය වෙයි. මෙය ලක්දිව ජනප්‍රියත්වයට පත් වී තිබූ ව්‍යාකරණ ග්‍රන්ථයකි. මෙහි දක්වන ව්‍යාකරණ විධීන්ගේ පහසුව නිසා පාලි ව්‍යාකරණ රචනයේ දී ගුරු කොටගත් බව සිතීමට පුළුවනි. භාෂාව කේන්ද්‍ර කරගනිමින් මහාවිහාර හා අභයගිරි ගැටුමෙන් අනතුරු ව සංස්කෘත භාෂාව ව්‍යවහාර වීම නිසා කාතන්ත්‍ර වැනි සංස්කෘත ව්‍යාකරණ ප්‍රචලිත වන්නට විය. එහි ප්‍රතිඵල වශයෙන් කච්චායන ව්‍යාකරණය රචනයේ දී කාතන්ත්‍ර ව්‍යාකරණය ආශ්‍රය කොට තිබෙන බව, සූත්‍ර අධ්‍යයනය කිරීමෙන් ස්ඵුට වෙයි. කාතන්ත්‍රයෙන් කච්චායනට නගාගත් සූත්‍ර තුලනාත්මක ව බැලීමෙන් සංස්කෘත ව්‍යාකරණයට තිබෙන නැඹුරුව ඉස්මතු ව පෙනෙයි. එම සූත්‍ර නම්,

| කා තන්ත්‍ර ව්‍යාකරණ සූත්‍ර | කච්චායන සුත්ත |
|---|---|
| 1. "කර්මප්‍රවචනීයෛශ්ච"[24] | 1. "කම්මප්පවචනීයුත්තෙ"[25] |
| 2. "පදේ තුල්‍යාධිකරණෙ විඥෙයඃ කර්මධාරයඃ"[26] | 2. "ද්විපදෙ තුල්‍යාධිකරණෙ"[27] |
| 3. "යඃ කරෝති සකර්තා"[28] | 3. "යො කරොති සකත්තා"[29] |
| 4. "සංඛ්‍යා පූර්වෝ ද්විගුරිති ඥෙය"[30] | 4. "සංඛ්‍යාපුබ්බො දිගු"[31] |
| 5. "හේත්ත්වර්ථෙ"[32] | 5. "හෙත්ථත්ථෙ ච"[33] |

කාතන්ත්‍ර ව්‍යාකරණය ගුරුකොට ගනිමින් කච්චායන හිමියන් ස්වකීය කච්චායන ව්‍යාකරණය රචනා කළ ආකාරය ඉස්මතු ව පෙනෙයි.

- **කච්චායන ව්‍යාකරණය පාණිනී ව්‍යාකරණය ගුරුකොට ගැනීම**

විශ්වකීර්තියට පත් වූ පාණිනී ව්‍යාකරණය අනන්‍ය ව්‍යාකරණයට වඩා අග්‍රේසර ව්‍යාකරණය වශයෙන් සලකනු ලබයි. සකල ව්‍යාකරණාංගයන්ගෙන් පාණිනී ව්‍යාකරණය පරිපූර්ණ බව ප්‍රකාශ කරයි. මූල සූත්‍ර අධ්‍යාය අටකින් කළ හෙයින් අෂ්ටාධ්‍යාය වශයෙන් ද, කර්තෘවරයාගේ නමින් ද හඳුන්වනු ලබයි. අනුපූර්ණය සඳහා කළ කොටස වාර්තිකය නමින් හැඳින්වෙයි. පාණිනී විසූ කාලය පිළිබඳ බොහෝ විද්වත්හු නිහඬ වෙති. ඒ. බෙරිඩේල්කීත් ප්‍රකාශ කරන්නේ *"අවාසනාවකට මෙන් පාණිනීගේ දිනවකවානු අවිනිශ්චිත ය "*[34] පාණිනී යාස්කට හා ශෞනකට පසු ව වාසය කළ බව්ත් වැඩි දුරටත් දක්වයි. අෂ්ටාධ්‍යායෙහි සූත්‍ර හාරදාසක් පමණ තිබේ. අධ්‍යාය අටකි. නාමපද හා විභක්ති, ධාතු, පද සාධනය හා උච්චාරණ විධි, වාක්‍ය වශයෙන් ග්‍රන්ථ සකසා තිබේ. ග්‍රන්ථයේ සුවිසල් බව සංක්ෂිප්ත කිරීමට නිතර කටයුතු කොට තිබෙන බව පෙනේ. පාණිනී විසින් රචිත ව්‍යාකරණ ග්‍රන්ථ අතර ශබ්දයන්ගේ ලිංග භේදය දැක්වීමට ලිංගානුශාසනය ද අක්ෂර ශික්ෂාව ඉගැන්වීමට ශික්ෂාව ද දක්නට ලැබේ. තත් ව්‍යාකරණය මුල්කොටගෙන ව්‍යාකරණ ග්‍රන්ථ රාශියක් රචනා වී තිබේ. ඒ අතර හර්තෘහරි විසින් රචනා කරන ලද මහාභාෂ්‍ය ව්‍යාඛ්‍යාව, ශ්‍රී කෘෂ්ණ විසින් කළ ප්‍රක්‍රියාකෞමුදී ව්‍යාඛ්‍යාව, විට්ටල විසින් කළ ප්‍රසාදය, ශ්‍රී තාරානාථ තර්කවාචස්පති භට්ටාචාර්යන් විසින් කළ සරලාව, ශබ්දාර්ථරත්න, ආශුබෝධ, ධාතුරූපාදර්ශ, ඥානේන්ද්‍ර සරස්වතී විසින් කළ තත්ත්වබෝධනය, භට්ටෝජීදීක්ෂිත විසින් කළ ශබ්දකෞස්තුභ, පෞඪමනෝරමා, සිද්ධාන්තකෞමුදි, ආදී ව්‍යාකරණ ග්‍රන්ථ රාශියක් වෙයි. කච්චායන ව්‍යාකරණය රචනයේ දී පාණිනී ව්‍යාකරණය ගුරුස්ථානයේ තබාගත් ආකාරය සූත්‍ර සංසන්දනාත්මක ව බැලීමෙන් පෙනී යයි.

| පාණිනී ව්‍යාකරණය | කච්චායනය |
|---|---|
| 1. "කර්මණි ද්විතියා"[35] | "කම්මත්ථෙ දුතියා"[36] |
| 2. "කර්මප්‍රවචනීයයුක්තෙ"[37] | "කම්මප්පවචනීයයුත්තෙ"[38] |
| "අපාදානේ පඤ්චමී"[39] | "අපාදානෙ පඤ්චමී"[40] |
| 3 "ස නපුංසකම්"[41] | "සො නපුංසකලිංගා"[42] |
| "සංඛ්‍යාපූර්වොඃ දිගු"[43] | "සංඛ්‍යාපුබ්බෝ දිගු"[44] |
| 4 "යෙනංගවිකාරඃ"[45] | "යෙනාංගවිකාරෝ"[46] |

සූත්‍ර රචනයේ දී බෙහෙවින් සංස්කෘත ව්‍යාකරණ ආශ්‍රය කොට තිබේ. එහි දී චාන්ද්‍ර, කාතන්ත්‍ර හා පාණිනී වැනි ව්‍යාකරණ පමණක් නො ව, පණ්ඩිත ශ්‍රී ගෝපාලශාස්ත්‍රී ආචාර්යයන් විසින් රචිත ලඝුශබ්දේන්ද්‍රශේඛරයේ දක්නට තිබෙන "සම්බොධන ච"[47] වැනි සූත්‍ර පවා පාලියට ගෙන තිබෙන බව පෙනේ.

පාලි ව්‍යාකරණ රචනයේ දී ඍජු ලෙස සංස්කෘත ව්‍යාකරණ ගුරු කරගැනීම උද්ධරණ සූත්‍ර පාඨයන් තුළින් සක්සුදක් සේ පැහැදිලි ය. පදසාධන සන්නයේ රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධම්මානන්ද නාහිමියන් ප්‍රකාශ කරන්නේ,

> "කච්චායන ව්‍යාකරණය රචනා කළ කසයින් හිමිපාණෝ ආචාර්ය සර්වවර්මන්ගේ කාතන්ත්‍ර ව්‍යාකරණය ගුරුකොට ගෙන ස්වකීය ව්‍යාකරණය රචනා කළෝ ය"[48]

මෙසේ පාලි ව්‍යාකරණ රචනයේ ප්‍රධාන වශයෙන් සංස්කෘත ව්‍යාකරණ ගුරුකෙට ගැනීම දෙස විමර්ශනාක්ෂියෙන් බැලුවහොත් පෙනී යන්නේ ආදි ව්‍යාකරණයක් වශයෙන් සංස්කෘත ව්‍යාකරණය පාලි භාෂා තත්වඥයින් පවා පරිශීලනය කිරීමයි. ඒ අනුව, සංස්කෘත ව්‍යාකරණ ගුරු කොට ගැනීම පිළිබඳ නිගමනයන් කීපයකට ළඟාවිය හැකි ය.

- සර්වසම්පූර්ණ ව්‍යාකරණයක් සංස්කෘත භාෂාවෙන් රචනා වී තිබීම.
- එකී ව්‍යාකරණවලින් පාලි ව්‍යාකරණ රචනා කළ වෛයාකරණඥයන් පවා ව්‍යාකරණ ඉගෙන ගැනීම.
- පාලි හා සංස්කෘත ද්විභාෂාවේ භාෂා නානත්වය මුත් ප්‍රයෝග නානත්වය විශේෂයෙන් විද්‍යමාන නො වීම.

තත් කරුණු දෙස ස්වාධීන ව බලන්නේ නම් මනා ව පැහැදිලි වන්නේ පාලි ව්‍යාකරණය සකසුරුවමේ දී සංස්කෘත ව්‍යාකරණයේ ඡායාවෙන් මිදීමට කිසිදු ව්‍යාකරණඥයෙක් සමර්ථ වී නොමැති බවත්; සද්දනීති ව්‍යාකරණයේ දක්නට ලැබෙන ස්වාධීන රචනා ගමන් මාර්ගය කච්චායන ව්‍යාකරණ හා මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායයන් දෙකෙන් ගම්‍ය නො වන බවත් පෙනීයයි.

## සද්දනීති ව්‍යාකරණය

පවත්නා භාෂාවකට ව්‍යාකරණ රචනා කිරීමේ දී භාෂාවේ දක්නට ලැබෙන දුෂ්කර අංශයන්ට ප්‍රථමයෙන් ව්‍යාකරණ ඉදිරිපත් කිරීම සිදුවිය යුත්තකි. එම ලක්ෂණය උසස් ව්‍යාකරණයන් සතුවෙයි. කච්චායන හා මොග්ගල්ලායන යන උභය ව්‍යාකරණ සම්ප්‍රදායයන්හි ම දක්නට ලැබෙන්නේ සාම්ප්‍රදායික ක්‍රමයට ප්‍රථමයෙන් වර්ණ මාලාව නිර්දේශ කිරීමයි. "*අක්ඛරාපාදයො එකචත්තාළීසං*"[49] හා "*අ ආදයො තිතාළීසාවණ්ණා*" වශයෙන් අක්ෂර පිළිබඳ ඉගැන්වීම ප්‍රථම කොට ඉදිරිපත් කරන අයුරු දක්නට ලැබේ. භාෂාවක් ඉගෙන ගන්නා ආධුනිකයාට එහි සෑම පදයක් ම නාම පද සේ පෙනීයාමට පුළුවනි. ඊට හේතුව ව්‍යාවෘත වාග් මාලාවේ වැඩි ප්‍රමාණයක් නාම පද වීමයි. එහෙත් ක්‍රියා පද තරමක් දුරට විග්‍රහ කර ගැනීම අපහසු ය. ක්‍රියා පදයේ ලිංගය, වචන, කාලය, පුරුෂ, විභක්ති, ආදී විවිධ අංශ ඔස්සේ විවරණය කොට ගැනීමට අවශ්‍යවෙයි. එම නිසා සද්දනීති කර්තෘතුමා ප්‍රථමයෙන් ධාතු පිළිබඳ ඉගැන්වීම සිදුකරමින් ස්වකීය ව්‍යාකරණය ආරම්භ කළ බව සිතීමට පුළුවනි. කෙසේවෙතත් උසස් ව්‍යාකරණයක ලක්ෂණයක් වශයෙන් සද්දනීති අනුදත් ක්‍රමය හැඳින්විය හැකි ය.

### පදමාලා කොටස

සද්දනීති ව්‍යාකරණය ආරම්භ කරන්නේ සවිකරණාඛ්‍යාත විභාග පරිච්ඡේදයෙනි. මෙම ප්‍රථම පරිච්ඡේදයේ සිට අත්ථන්තික විභාග නම් වූ දාහතර වන පරිච්ඡේදය දක්වා පද මාලාව පිළිබඳ උගන්වනු ලබයි. පරිච්ඡේද දාහතරක් ඒ සඳහා වැය කොට තිබේ. එහි දී ධාතු හා නාම යන පද දෙවර්ගය පිළිබඳ සවිස්තරාත්මක ව ඉදිරිපත් කරයි. ප්‍රථම පරිච්ඡේද හතර ධාතු පිළිබඳවත් පස්වැනි පරිච්ඡේදයේ සිට දාහතරවන පරිච්ඡේදය දක්වා නාම පද පිළිබඳවත් උගන්වයි. ධාතු පිළිබඳ හඳුන්වා දෙන්නේ මෙසේ ය,

කවරාර්ථයෙන් ධාතු වන්නේ ද? ස්වකීය ස්ථානය දැරීම් අර්ථයෙන් හා අත්ථාතිසය සංයෝගය පරාර්ථ වශයෙන් දරන හෙයින් ධාතු වන බව මෙයින් දැක්වේ.[50] ඉන් අනතුරු ව නාම පිළිබඳ හඳුන්වා දෙයි. නාම නාම, කිතක නාම, සමාස නාම හා තද්ධිත නාම වශයෙන් සතරාකාර වන බවත් නාම ප්‍රත්‍යය හා ආඛ්‍යාත ප්‍රත්‍යය වශයෙන් දෙවැදෑරුම් වන බව දක්වයි. ක්‍රියා පදයේ ලක්ෂණ කථනය කරනු ලබන්නේ මෙසේ ය,

> *"ඉමමත්ථංහි සන්ධාය වුත්තමාචරියන්හි,*
> *මහාවෙයාාකරණෙහිනිරුත්තිනය දස්සිහි*
>
> *යං තිකාලං තිපුරිසංක්‍රියාවාචී තිකාරකං,*
> *අත්තිලිංගං ද්විවචනංතදාඛ්‍යාතන්ති වුච්චති"*[51]

යන සද්දූපදේශනය උද්ධරණය කරමින් එකී ආඛ්‍යාත ලක්ෂණ සවිස්තර කථනයක යෙදෙයි. දෙවැනි පරිච්ඡේදය ආරම්භ කරන්නේ මෙසේ ය, "ඉති පරං පවක්කාමි සොතුනං මතිවඩ්ඪනං ක්‍රියාපදක්කමං නාමවිභත්‍යාදීනං දීපයං" ක්‍රියා පද වරනගන්නා වූ ක්‍රියා විභක්ති ඉන් අනතුරු ව දක්වා තිබේ.

01. වත්තමාන
02. පංචමී
03. සත්තමී
04. පරොක්ඛා
05. හීයත්තනී
06. අජ්ජතනි
07. භවිස්සන්ති
08. කාලාතිපත්ති

යන විභක්තීන්ට අදාළ ආඛ්‍යාතප්‍රත්‍යයන් නිර්දේශ කරමින් උදාහරණ ගෙන හැර දක්වයි. ආඛ්‍යාත විභක්ති අට යෙදෙන කාල දක්වන්නේ ඉන් අනතුරු වයි. ඒ ඒ ආඛ්‍යාත විභක්ති භාවිත කළ හැකි මර්යාදාවන් ඉන් ප්‍රකාශිත ය.

වර්තමාන කාලය ප්‍රකාශ කිරීමේ දී වත්තමාන් විභක්තියත්, ආශිර්වාදකථනයේ දී පංචමී ද, වර්තමානයෙහි අනුමති, පරිකල්පන, ප්‍රාර්ථනා, විධි, ප්‍රශ්නාර්ථ හා නිමන්ත්‍රණාර්ථයෙහි සත්තමී ද ඇසට හසු නො වූ අතීතය පරොක්ඛා ද, ඊයේ පටන් දත් නො දත් අතීතය හීයත්තනී ද, පෙර

සිට වත්මන දක්වා අජ්ජතනි ද යම්කිසි හේතුවකින් ක්‍රියාවක් වැළැක්වේ ද එය කාලාතිපත්ති හා අනාගත සිදුවන්නා වූ දේ භවිස්සන්ති විභක්තියෙන් ද තබනු ලබයි.[52] ආඛ්‍යාත විභක්තිවල ක්‍රියා මූලයන් යොදන ආකාරය මෙහි දී විශේෂ වශයෙන් උගන්වයි. හතර වන පරිච්ඡේදයේ දී ප්‍රකීර්ණක (සංග්‍රහ) විනිශ්චය කරන බව දක්වමින් පරිච්ඡේදය ආරම්භ කරයි. අත්ථුද්ධාර, අත්ථසද්දචින්ති, අත්ථාතිසයයෝග, සමානාසමානවසේන වචනසංගහෝ, ආගමන ලක්ඛණවසේන විභක්ති වචන සංගහෝ, කාලවසේන විභක්ති සංගහෝ, කාල සංගහෝ, පකරණ සංසන්දනා, වත්තමාදීනං වචනත්ථවිභාවනා යන කරුණු නමය පිළිබඳ විස්තර කරයි. මෙම පරිච්ඡේද හතර ම වැය කරන්නේ ධාතු පද මාලාව විස්තර කිරීම සඳහා ය.

නාම පද මාලාව පිළිබඳ සද්දනීති ව්‍යාකරණයේ පස්වැනි පරිච්ඡේදයේ සිට දහනම වන පරිච්ඡේදය අවසානය දක්වා දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කරනු ලබයි. පස්වැනි පරිච්ඡේදය ආරම්භ කරන්නේ මහාකච්චායන හිමියන් කළ නිරුත්ති පිටකය හා යමක හිමියන් කළ චූලනිරුත්තියේ දැක්වෙන නාම පිළිබඳ සඳහන සනිටුහන් කරමින් ය. නාම පදය ලිංග, වචන හා විභක්ති වශයෙන් විභේදනය දක්වයි. ප්‍රථමයෙන් විභක්තීන්ට අදාළ විභක්ති ප්‍රත්‍ය යෙදෙන ආකාරය උගන්වයි. ආලපන විභක්තියේ දී ඒකවචන හා බහුවචනය සඳහා යෙදෙන ආමන්ත්‍රණාර්ථ පදය ලෙස භො සහ භවන්තො යනුවෙන් යෙදෙන බව (*භො පුරිස භවන්තො පුරිසාති ඉමෙහි වචනෙහි'පි දූරට්ඨානේ ච අදූරට්ඨානේ ච ආයතනෙන සරේන ආමන්තණමේව පමාණං දීඝරස්සමත්තා විසෙසො තස්මා භො සත්ථ, භො රාජ, භො ගච්ඡ, භො මුනි)* දක්වයි. අකාරාන්ත පුරුෂ ලිංග ශබ්ද දැක්වීමෙන් අනතුරු ව මනෝගණික ශබ්ද උගන්වනු ලබයි. එම ගණයේ ශබ්ද දාසයක් පෙන්වා දෙයි. පස්වෙනි පරිච්ඡේදය ආරම්භ කරන්නේ (*අථ පුබ්බාචරිය මතං පුරේචරං කත්වා ආකාරාන්තපුල්ලිංගානං පකති රූපේසු අභිභවිතුං ඉච්චෙතස්ස පකතිරූපස්ස නාමිකපදමාලං වක්කාමි)* ආකාරාන්ත පුල්ලිංග නාම පද ඉදිරිපත් කරන බව දක්වමින් ය. නාමශේෂ ව්‍යාකරණ ග්‍රන්ථයන්ගේ පාඨාන්තරෝද්ධරණය කරයි. සත්ථු (ශාස්තෘ) ශබ්දයේ පඨමා විභක්ති ඒකවචනයේ සත්ථුනා රූපය පිළිබඳ යම් ගැටලුවක් පෙන්වා දෙයි. චූලනිරුත්ති ව්‍යාකරණය හා කච්චායන ව්‍යාකරණය අනුදත් මාර්ගය වන්නේ "සත්ථුනා" යන්නයි. එහෙත් මෙහි දී එකී නාම පද රූපය තතියා ඒකවචන රූපය ලෙස යෝජනා කරයි. හත්වැනි පරිච්ඡේදයේ දී ගච්ඡන්ත ආදී ශබ්ද පිළිබඳ උගන්වයි. මෙහි දී ගච්ඡන්ත ශබ්දය නිග්ගහීතාන්ත පුල්ලිංග ශබ්දයක් වශයෙන් හඳුන්වා දෙන අතර

කච්චායන සම්ප්‍රදායයෙන් බැහැර වී ඇති බව පෙනෙයි. එය කච්චායන හා සද්දනීති ව්‍යාකරණයේ දී ගච්ඡන්ත ශබ්දය වරනගන ආකාරය සංසන්දනාත්මක ව බැලිය යුතු ය. ඒ අනුව,

**ගච්ඡන්ත ශබ්දය කච්චායන සම්ප්‍රදාය**

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | ගච්ඡං | ගච්ඡන්තා, ගච්ඡන්තානි |
| ආලපන | (භවං) ගච්ඡං, ගච්ඡ, ගච්ඡා | (භවන්තානි) ගච්ඡන්තා, ගච්ඡන්තානි |
| දුතියා | ගච්ඡන්තං | ගච්ඡන්තේ, ගච්ඡන්තානි |
| තතියා | ගච්ඡතා, ගච්ඡන්තේන | ගච්ඡන්තේභි, ගච්ඡන්තේහි |
| කරණ | ගච්ඡතා, ගච්ඡන්තේන | ගච්ඡන්තේභි, ගච්ඡන්තේහි |
| චතුත්ථි | ගච්ඡන්තෝ, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තිනං |
| පඤ්චමී | ගච්ඡතො, ගච්ඡන්තස්ස, ගච්ඡන්තම්හා, ගච්ඡන්තස්මා | ගච්ඡන්තේභි, ගච්ඡන්තේහි |
| ඡට්ඨී | ගච්ඡතෝ, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| සත්තමී | ගච්ඡතෝ, ගච්ඡන්තස්ස, ගච්ඡති, ගච්ඡන්තේ, ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං | ගච්ඡන්තේසු |

**ගච්ඡන්ත ශබ්දය සද්දනීති සම්ප්‍රදාය**

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | ගච්ඡන්තෝ | ගච්ඡන්තෝ, ගච්ඡන්තා |
| දුතියා | ගච්ඡන්තං | ගච්ඡන්තේ |
| තතියා | ගච්ඡන්තා | ගච්ඡන්තේභි, ගච්ඡන්තේහි |
| චතුත්ථි | ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| පඤ්චමී | ගච්ඡතා | ගච්ඡන්තේභි, ගච්ඡන්තේහි |
| ඡට්ඨී | ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| සත්තමී | ගච්ඡති, ගච්ඡන්තේ | ගච්ඡන්තේසු |
| ආලපන | (භො) ගච්ඡ, ගච්ඡා | (භවන්තෝ) ගච්ඡන්තෝ, ගච්ඡන්තා, |

යමක තෙරුන් චූලනිරුත්තියේ දී තතියා ඒකවචනය ගච්ඡන්තේන, ගච්ඡන්තා ගච්ඡන්තම්හා, ගච්ඡන්තස්මා, ගච්ඡන්තස්මි යන රූප දක්නට නොමැති බව අග්ගවංස පාදයෝ ප්‍රකාශ කරති. කච්චායන ව්‍යාකරණයේ ශබ්ද නාමයක් වශයෙන් අප්‍රකට අරහන්ත ශබ්දය පිළිබඳ විස්තර දක්වයි. අරහන්ත ශබ්දය ගුණ ශබ්දයක් හෙයින් අවිසේසයෙන් අරහා, අරහන්තෝ, අරහන්තා යන රූපවල යෙදෙන බව මෙසේ දක්වයි. (*ඉති ච ඒතං හි සමන්තපාසාදිකායං මනුස්සවිග්ගහට්ඨානේ දිස්සති, උත්තරිමනුස්ස ධම්මපාලියං පන මයඤ්චමතා අරහන්තෝති පදං දිස්සති*) එසේ ම අරහ ශබ්දය ස්ත්‍රී ලිංග නපුංසක ලිංග වශයෙන් බෙදීමක් ප්‍රකට නො වන බව වශයෙන් (*ඉධ ඉත්ථීනපුංසකලිංග වසේන විසුතං වත්තබ්බනයෝ අප්පසිද්ධෝ*) දක්වයි. මෙම පරිච්ඡේදයේ දී ඉකාරාන්ත පුල්ලිංග ශබ්ද දක්වා විස්තර කරයි.

හත්වන පරිච්ඡේදය ආරම්භ කරන්නේ (*ඉදානි භාවී ඉච්චේතස්ස පකතිරූපස්ස අඤ්ඤෙසඤ්ච තංසදිසානං නාමිකපදමාලා විභාගං වක්ඛාම පුබ්බාචරියමතං පුරේචරං කත්වා*) වශයෙන් දණ්ඩී හා භාවී යන ශබ්දයන් සේ ම වරනැගෙන ශබ්ද පනස් තුනක් පෙන්වා දෙයි. ඉන් අනතුරු ව ඊකාරාන්ත පුල්ලිංග, උකාරාන්ත පුල්ලිංග, ඌකාරාන්ත පුල්ලිංග වශයෙන් නාම වරනැගීමේ ලක්ෂණ මෙන් ම ස්ථානයේ දී පද යෝජනා කරයි. අට වන පරිච්ඡේදයේ දී ස්ත්‍රී ලිංග නාම පද වරනැගීම උගන්වයි. එහි දී කඤ්ඤා, භවිතා, මාතා, ධීතා, යන ශබ්ද අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත හා ඔකාරාන්ත වශයෙන් වරනගයි. නමවන පරිච්ඡේදය ආරම්භ කරන්නේ නිග්ගහීත නපුංසක ලිංග චිත්ත ශබ්දය වරනැගීමෙනි. භූත, කම්ම, ගුණව, කරොන්ත, ගච්ඡන්ත, දක්වමින් නපුංසක ශබ්ද වරනැගීමේ ක්‍රමය විස්තර කරයි.

දහවැනි පරිච්ඡේදය ආරම්භකරන්නේ (*අයං ලිංගත්තයමිස්සකෝ නාමිකපදමාලා උද්දේසේ තත්‍ර*) යනුවෙන් ලිංගත්‍රයෙහි මිශ්‍ර ශබ්ද උගන්වනු ලබයි. ප්‍රථමයෙන් ම ඉත්ථි ලිංග ශබ්ද දක්වන අතර එකොළොස් වන පරිච්ඡේදයේ දී ගුණ නාම පිළිබඳ උගන්වයි. සර්ව නාම පිළිබඳ උගන්වන්නේ දොළොස් වන පරිච්ඡේදයේය. එය,

"*සබ්බසාධාරණතානිනාමානිච්චේව අත්ථතො,*
*සබ්බනාමාති වුච්චන්ති සත්තවීසති සංඛතෝ*"[53]

සර්වසාධාරණ නාම වශයෙන් දක්වන අතර සංඛ්‍යාත්මක ව ප්‍රකෘති විසිහතක් පෙන්වාදෙයි. ඒ අනුව, "*සබ්බ, කතර, කතම, උභය, ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, පුබ්බ, පර, අපර, දක්ඛිණ, උත්තර, අධර, ය, ත, එත, ඉම, අමු, කිං, එක, උභ, ද්වි, ති, චතු, තුම්හ. අම්හ*"[54] විටෙක සද්දනීති කර්තෘ නාමශේෂ පාලි ව්‍යාකරණය තුළ දක්නට ලැබෙන්නේ පච්චත්ත, උපයෝග, භුම්ම, කරණ යන විභක්ති එකී අර්ථයෙන් ම භාවිත කරයි. දහතුන් වන පරිච්ඡේදයේ දී සංඛ්‍යානාම උගන්වයි. එක, දෙක, තුන හා හතර ආදී සංඛ්‍යානාම පිළිබඳ මෙසේ දක්වයි. "*යාහි සා හෙට්ඨා අම්හෙහි එක ද්වි ති චතු ඉච්චේතේසං සංඛ්‍යා සබ්බනාමානං නාමිකපදමාලා කථිතා*"[55] සංඛ්‍යා සර්වනාම මෙහි දී උගන්වනු ලබයි. අකම්මක, සකම්මක හා සුද්ධකත්තරි වශයෙන් ඉදිරිපත් කරයි. එසේ ම (*ත්වායන්තපදානි වුච්චතේ*) යනුවෙන් පූර්ව ක්‍රියා දක්වයි. අත්ථන්තික නම් දාහතර වැනි පරිච්ඡේදය දක්වා පද මාලා කොටසට අයත් වූ ව්‍යාකරණ විධීන් උගන්වයි. මෙහි දී නාම පිළිබඳ සවිස්තර කථනයක් ඉදිරිපත් කරන අතර සමහර පරිච්ඡෙද නාම වරනැගිල්ලක ස්වරූපයක් ඉස්මතු ව පෙනේ. එහෙත් සද්දනීති ව්‍යාකරණ කර්තෘවරයා අන්‍යමතයන් පෙන්වා දෙමින් ස්වමතය ස්ථාපනය කරනු ලබයි. මෙම කොටස පදමාලා නමින් හඳුන්වයි.

## ධාතුමාලා කොටස

ධාතුමාලා කොටස පරිච්ඡේද පහක අන්තර්ගත වෙයි. එනම් නාම ධාතු විභාග පරිච්ඡේදයේ සිට දහනම වන සබ්බගුණ විනිච්ඡය නම් පරිච්ඡේදය දක්වා ධාතුමාලාව උගන්වයි. ප්‍රථමයෙන් ම "ඉ" ධාතුව දක්වයි. (*ඉ ගතියං යෙසං ධාතුනං ගති අත්ථො, පවත්ති පාපුණාති'පි. තත්‍ර ගමනං දුවිධං කායගමනං ඤාණගමනඤ්ච, තෙසු කායගමනං නාම ඉරියාපථ ගමනං ඤාණගමනං නාම ඤාණුප්පත්ති, තස්මා පයොගානුරූපේන ගච්ඡතී'ති. පදස්ස ජානාතී'ති'පි අත්ථො භවති. පවත්තතී'ති'පි අත්ථො භවති. පාපුණාතී'පි 'පි අත්ථො භවති, .............. ධාතුනං යථාපයොගං අත්ථො ගහෙතබ්බො. තස්සිමානි රූපානි භවන්ති. ඉති, එති, උදෙති*) වශයෙන් ධාතු මූලයන් හා ප්‍රත්‍ය එක්වීමෙන් සෑදෙන්නා වූ ආඛ්‍යාත පද මෙහි උගන්වයි. කච්චායන ව්‍යාකරණයේ දී "*ඉ අජ්ඣානෙ, ගතිම්හි*"[56] (*to study, to go*) දැරීමෙහි හා යාමෙහි "*උපෙති*"[57] ඉ ධාතුව ගමනාර්ථයෙන් දෙවැදෑරුම් වෙයි. සාමාන්‍ය පියවි ගමන හා ඤාණමය වූ ගමන වශයෙනි. ඉ ධාතුව පිළිබඳ දීර්ඝ විස්තරයක් උදාහරණ සහිත ව විස්තර කරනු ලබයි. ඉන් අනතුරු ව ධාතු

පෙළ ගස්වා තිබෙන්නේ, ක, ඛ, ග, ඝ, ච, ඡ, ජ, ඣ, ඤ, ට, ඨ, ඩ, ඪ, ණ, ත, ථ, ද, ධ, න, ප, ඵ, බ, භ, ය, ර, ල, ව, ස, හ, ළ යන අක්ෂරාන්ත වන පරිදි ය. පක්ක ධාතුව ඉදිරිපත් කරයි. *(පක්ක, නීච ගතියං)* හීන ගමන් ප්‍රකාශනයේ දී පක්ක ධාතුව භාවිත කරයි. මෙම ධාතුව කච්චායනයේ දී දක්නට නොමැති වීම විශේෂත්වයකි. දහ අට වන පරිච්ඡේදය දක්වා ධාතු මාලාව දක්වන අතර ධාතුමඤ්ජුසාවක විහිත කාර්ය පෙන්නුම් කරයි. දහනම වන පර්ච්ඡේදය ආරම්භ කරන්නේ,

> *"ඉතොපරං පවක්ඛාමිසබ්බගණවිනිච්ඡයං,*
> *සොතූනං පටුභාවත්ථංපරමේ පිටකත්තයේ.*
>
> *පච්චයාදිවිභාවෙතිනයේහි විවිධෙහි තං,*
> *සුඛග්ගහාය සොතූනංසුණාථ මම භාසතො"*[58]

යනුවෙන් ධාතු ගණ ඉදිරිපත් කරයි. බුද්ධ භාෂිතයෙහි ධාතු ගණ අටක් හා විකරණ සොයා ගැනීමට පුළුවන් බව පෙන්වා දෙයි. *(ඉමස්මිං භගවතො පාවචනේ අට්ඨවිධා ධාතුගණා භවන්ති ඒ තේසු විකරණප්පච්චයවසේන)* ධාතුගණ වශයෙන් පෙන්වා දෙන්නේ,

01. භූවාදිගණ
02. රුධාදිගණ
03. දිවාදිගණ
04. ස්වාදිගණ
05. කියාදිගණ
06. ගහාදිගණ
07. තනාදිගණ
08. චුරාදිගණ

ගණ අටයි. ධාතු ගණ අට දක්වීමෙන් අනතුරු ව ඊට අදාළ විකරණ දක්වනු ලබයි. ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරෙහි විකරණ නමින් හැඳින්වෙන ප්‍රත්‍ය සමූහයක් යෙදෙයි.[59]

ධාතු ගණවලට පිළිවෙළින් අ, ං පූර්ව අ, ය, ණු-උණා-ණා, නා, ඔ-යිර, ණෙ-ණය, යන විකරණයන් උගන්වනු ලබයි. දහ අටවන පරිච්ඡේදය හා දහනම වන පරිච්ඡේදයේ දී ධාතු ගණ උදාහරණ මගින් විවිධ කොටස් දක්වමින් උගන්වනු ලබයි.

## සුත්තමාලා කොටස

සාම්ප්‍රදායික ව්‍යාකරණ ග්‍රන්ථවල මෙන් ම ව්‍යාකරණ විධීන් උගන්වන විසිවන සන්ධිකප්පනාම පරිච්ඡේදයේ සිට විසි අටවන පාලිනයාදි සංගහො පරිච්ඡේදය දක්වා කොටස සුත්තමාලා නමින් හඳුන්වයි. මෙම පරිච්ඡේදය ආරම්භ කරන්නේ නමස්කාරයකින් ආරම්භකරන හෙයින් මහාසද්දනීතිප්පකරණයේ ද්විතීය කොට්ඨාසය වශයෙන් සමහර විද්වත්හු හඳුන්වති. විසිවන පරිච්ඡේදය ආරම්භ කරන්නේ (*ඉතො පරං පවක්ඛාමි උද්දේසානුක්කමේන සලක්ඛණො සන්ධි නාමාදි භේදො භවිස්සති. එත්ථච'ලක්ඛණ'න්ති සුත්තං වුච්චති සුත්තස්සහි අනේකානි නාමානි සුත්ත, ලක්ඛණ, වචනං, යොගා, ආරම්භො, සත්ථ, වාක්‍යායත්න'න්ති*) වශයෙන් පූර්වයේ ප්‍රකාශිත ආකාරයට ලක්ෂණ සහිත ව සන්ධි නාම භේද වන්නේ ය. එහි ලක්ෂණ සූත්‍ර මාර්ගයෙන් ප්‍රකාශ කරන අතර සූත්‍රයන්ගේ නොයෙක් සූත්‍ර, ලක්ෂණ, වචන, යෝග, ආරම්භ, ශාස්ත්‍ර, වාක්‍යාන්ත කොට ප්‍රකාශ වෙයි. මෙහි දී සන්ධි යන්න ප්‍රායෝගික ව තේරුම් ගැනීමට ඇවැසි ආකාරයට අග්ගවංසපාදයෝ උපමා සහිත ව පැහැදිලි කරති. ඒ අනුව,

සන්ධි නාම කාර්යය සියලු ව්‍යඤ්ජනයන්හි ලුණු ධූමය මෙන් ද රාජකෘත්‍යයෙහි සියල්ල සිදුකරන ඇමතියන් මෙන් ද සන්ධි නාම කාර්යය සියලු දේ හි ප්‍රමුඛතම කාර්යය බව ප්‍රකාශ කරති.[60] ප්‍රථමයෙන් ම (*තස්මා සන්ධිනාමකාරකසමාසාදිප්පභේදේසු සන්ධිප්පභේදං පකාසිස්සාමි. එවං තං පකාසෙන්තො'වා'හං පඨමතරං වණ්ණුත්තමුපගතස්ස සද්දස්සු'ප්පත්තිංයේ'ව සඤ්ඤාවිධානාදීහි සද්ධිං පකාසෙස්සාමි*) සන්ධි නාම කාරක සමාසාදියෙන් සන්ධි පිළිබඳ ප්‍රථමයෙන් ප්‍රකාශ කරන බවත් එසේ ප්‍රකාශ කරමින් වර්ණ පිළිබඳ සංඥා විධාන ප්‍රකාශ කරමින් සුත්තමාලා කොටස ආරම්භ කරයි. වර්ණයන්ගේ උප්පත්තිය උරසි (ළය) කණ්ඨ (උගුර) සිරසි (මුදුන) යන ස්ථානත්‍රයෙන් උපදින බවත් විශේෂයෙන් පමණක් බුදුරදුන් කල්පසිය දහසකට අධික අසංඛ්‍ය සතරක් දානසීලා දී පාරමිතා සුපූරණය කළ පිනෙන් අතිපාරිශුද්ධ වූ නාභියේ පටන් හටගත් මහාබ්‍රහ්ම ස්වරය මෙන් පිත් සෙම්වලින් පළිබද්ද නො වී පිරිසිදු අෂ්ටාංගයෙන් ශබ්ද උත්පාදය කරති. බුද්ධ විෂයට පමණක් සුවිශේෂ වූ ශබ්දෝත්පත්ති අෂ්ටාංගය නම්,

*"විස්සට්ඨමඤ්ජුවිඤ්ඤෙය්‍යා-සවනීයා'විසාරිනො,*
*බින්දු ගම්භීරනින්නාදිත්-ථේවමට්ඨංගිකො සරා"*[61]

යන අංග බුදුරදුන්ගේ ස්වරයේ පවත්නා බව පෙළ සාහිත්‍යයේ හමුවෙයි. චිත්තජ ශබ්දයන් කණ්ඨ, තාලු, මුද්ධ, දන්ත, ඔට්ඨ, යන ස්ථාන පහ තුළ ශබ්ද ගැටීමෙන් වණ්ණ බවට පත්වෙයි. වර්ණෝත්පත්තිය දක්වා සූත්‍ර වෘත්ති හා අවුත්ති දක්වන බව *(ඉමස්මිං සද්දනීතිප්පකරණෙ සුත්තානි සවුත්තකානි ච අවුත්තිකා ච කත්වා වදාම)* ප්‍රකාශ කරයි.

සද්දනීති ව්‍යාකරණයේ වර්ණ නිර්දේශ සිදුකරන්නේ මෙසේ ය. *"අප්පභුතෙතෙ'කාතාළීසසද්දා වණ්ණා"* යනුවෙන් වර්ණ හතළිස් එකක් (41) පාලි භාෂාව සඳහා නිර්දේශ කරයි. සඤ්ඤාවිධාන කොටසේ දී සූත්‍ර 21 මුල් කොටගෙන වර්ණමාලාවේ කොටස් පෙන්වා දෙයි. තිස්වන සූත්‍රයේ සිට සන්ධි කාණ්ඩය ආරම්භ කරයි. එහි දී

සන්ධි යනු පද හා අක්ෂර එකතු කිරීමයි. අතරක් නො දක්වා පදයන් සන්ධි කිරීමයි. ස්වරාක්ෂර එකතු කිරීම ස්වර සන්ධි නම් වෙයි. එහි දී ස්වරාක්ෂර ආදේශ හා ලෝපය ආදී සන්ධි කාර්යයන්ගෙන් පද එකතු කිරීම ස්වර සන්ධි නමින් හඳුන්වයි.[62] (සරා සරෙ ලොපං - කච්චායන ව්‍යාකරණ 12 සූත්‍රය) හා (සරො ලොපො සරෙ - මොග්ගල්ලායන ව්‍යාකරණ 1 සූත්‍රය) මෙන් ම සද්දනීති ව්‍යාකරණයේ දී ස්වර අක්ෂර එකතු කිරීම පිළිබඳ ප්‍රථම සූත්‍රය ලෙස (සරා ලොපං පප්පොන්ති සරෙ) යනුවෙන් සරසන්ධි සූත්‍රය දක්වයි. දීර්ඝ ස්වර පරකල්හි අ ස්වරයේ පටන් පිළිවෙළින් ඔ ස්වරය ලෝපය දක්වා උදාහරණ සහිත ව විස්තර කරයි. සූත්‍ර 61 ස්වර සන්ධි කොටස සඳහා භාවිත කොට තිබේ. ව්‍යඤ්ජන සන්ධි ආරම්භ කරන්නේ 64 වන (සරා බ්‍යඤ්ජනෙ දීඝං) සූත්‍රයෙන් ය. ඉන් අනතුරු ව වෝමිස්සක සන්ධි ඉදිරිපත් කරයි.

ස්වර, ව්‍යඤ්ජන හා නිග්ගහීත යන සන්ධිත්‍රයේ ම කාර්යයන් සිදුවන හෙයින් වෝමිස්සක සන්ධි නම් වෙයි.[63] සාධාරණ සන්ධි හා වුත්තසන්ධි මෙම වෝමිස්සක සන්ධිය හඳුන්වන පර්යාය නම් වශයෙන් පෙන්වා දෙයි. 134 සූත්‍රයේ සිට 191 සූත්‍රය දක්වා මෙම සන්ධිය විස්තර කරයි. ඉන් අනතුරු ව ලිංග පිළිබඳ උගන්වයි. *(විසදභාවා'දිසහිතං ලීනස්ස'ත්ථස්ස ගමකං නිප්ඵන්න වචනං ලිංග නාම භවති)* යනුවෙන් ලිංග තුනක් පෙන්වා දෙයි.

01. විසද පුරුෂ ලිංග
02. අවිසද ස්ත්‍රී ලිංග
03. නේව අවිසද න අවිසද නපුංසක ලිංග

වශයෙන් ලිංග භේදය සඋදාහරණ ව උගන්වමින් නාම විභත්ති ප්‍රත්‍යය නිර්දේශ කරයි. 192 සූත්‍රයේ සිට 546 සූත්‍රය දක්වා නාම උගන්වයි. ඉන් අනතුරු ව කත්තු, කම්ම, කරණ, සම්ප්‍රදාන, අපාදාන හා ඕකාස යන ඡකාරක උගන්වමින් විසිවන පරිච්ඡේදය නිමා කරයි. විසි එක්වන පරිච්ඡේදය ආරම්භ කරමින් සමාස පිළිබඳ 675 සූත්‍රයේ සිට 750 සූත්‍ර දක්වා උගන්වනු ලබයි. මෙම විසිඑක්වන පරිච්ඡේදය අවසන් කරන්නේ,

*"සද්දනීතිප්පකරණෙ කාරක විභාගො නාම එකවීසතිමො පරිච්ඡේදො"*[64]

සද්දනීතිප්‍රකරණයේ කාරක විභාගය නම් විසිඑක්වන පරිච්ඡේදය අවසන්වන බව දක්වමින් ය. ඉන් අනතුරු ව අවසන් කළ යුතු පරිච්ඡේදය වන්නේ විසිදෙවන පරිච්ඡේදයයි. එහෙත් 1909 අරුක්ගොඩ සීලානන්ද හිමි සංස්කරණ (පාලි) මහාසද්දනීතිප්පකරණයේ විසිදෙවන පරිච්ඡේදය අවසන් කිරීමක් සටහන් නො වේ. එය ග්‍රන්ථයේ පරිච්ඡේද විභජනයේ දෝෂයක් වශයෙන් පෙන්වා දීමට පුළුවනි. ඉන් අනතුරු ව විසිතුන්වන පරිච්ඡේදය අවසන් කරයි.

*"තෙවීසතිමො පරිච්ඡේදො සද්දනීතියා සමාසප්පකරණං නිට්ඨිතං"*[65]

විසිහතර වන පරිච්ඡේදයේ තද්ධිත පිළිබඳ උගන්වනු ලබයි. 751 වන සූත්‍රයේ සිට 864 වන සූත්‍රය දක්වා තද්ධිත අන්තර්ගත වෙයි. විසිපස් වන පරිච්ඡේදය ආරම්භ කරන්නේ *"තත්ථ ක්‍රියං අක්ඛායතී'ති ආඛ්‍යාතං"*[66] ක්‍රියාර්ථය ප්‍රකාශ කරන්නේ ආඛ්‍යාත වශයෙනි. 865 වන පුබ්බානි විභත්තීනං ඡ පරස්සපදානි යන සූත්‍රයෙන් වර්තමාන කාල පරස්ස පදයට අදාළ ධාතු ප්‍රත්‍යය උගන්වයි.[67] ප්‍රථමා මධ්‍යම උත්තම යන පුරුෂත්‍රයට අයත් ධාතු ප්‍රත්‍යය වෙන් වෙන් ව නිර්දේශ කොට තිබේ. 1105 වන සූත්‍රය ආඛ්‍යාත විස්තර කරමින් විසිපස්වන පරිච්ඡේදය අවසන් කරයි. විසිහය වන පරිච්ඡේදය 1106 වන සූත්‍රයෙන් ආරම්භ කොට 1347 වන සූත්‍රයෙන් අවසන් කරයි. එහි දී කෘදන්ත පිළිබඳ උගන්වයි. විසිහත් වන පරිච්ඡේදය ආරම්භ කරන්නේ මෙසේ ය,

නාම, ආඛ්‍යාත, උපසග්ග හා නිපාත පද පිළිබඳ මෙම පරිච්ඡේදයේ දී උගන්වනු ලබයි.[68] නාමය පිළිබඳ හා නාමයේ විවිධ කොටස් විස්තර කරයි. ද්විධ, ත්‍රිවිධ, චතුර්විධ, ඡබ්බිධ හා ෂඩ්විධ වශයෙන් නාමයන්ගේ කොටස්

දක්වයි. ආඛ්‍යාත පද විභත්ති අනුව දක්වයි. උපසග්ග පද විස්සක් දක්වන අතර එකී උපසර්ග විහිතාර්ථය ද දක්වයි. නිපාත පද රාශියක් යෙදෙන අර්ථයන් සමග දක්වයි. අවසාන පරිච්ඡේදය වන විසි අටවන පරිච්ඡේදයේ දී උගන්වනු ලබන්නේ පෙළ, අට්ඨකථා, ටීකා හා ප්‍රකරණවල නය ක්‍රමයයි. අක්ඛර පද බ්‍යඤ්ජන ආකාර නිරුත්ති නිද්දේස යන බ්‍යඤ්ජන පද හය හා සංකාසන පකාසන විවරණ විභජන උත්තානීකරණ පඤ්ඤත්ති යන අත්ථපද හය පිළිබඳ උදාහරණ සහිත ව විස්තර කරයි. අවසාන පරිච්ඡේදය සද්දනීතියට පරිශිෂ්ටයක් හා සමාන වන සේ රචනා කොට තිබේ. සුත්තමාලා කොටස තුළ සූත්‍ර පමණක් නොව ඊට අදාළ ව්‍යාකරණ සංග්‍රහ කොට තිබේ.

---

**ආන්තික සටහන් (Endnotes)**

[1] සංස්කෘත සාහිත්‍යය, 545 පිටුව, සේනානායක. ජී. එස්. බී. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම කොළඹ. සම්භාෂා (10 කලාපය) 125 පිටුව

[2] චාන්ද්‍ර ව්‍යාකරණය, 1 පිටුව,

[3] මොග්ගල්ලායන ව්‍යාකරණය, 1 පිටුව, දේවමිත්ත හිමි (සංශෝධන) කොළඹ, 1919

[4] චාන්ද්‍රව්‍යාකරණය, 11 පිටුව

[5] මොග්ගල්ලායන ව්‍යාකරණය, 02 පිටුව

[6] චාන්ද්‍ර ව්‍යාකරණය, 13 පිටුව

[7] මොග්ගල්ලායන ව්‍යාකරණය, 03 පිටුව

[8] චාන්ද්‍ර ව්‍යාකරණය, 11 පිටුව

[9] මොග්ගල්ලායන ව්‍යාකරණය, 02 පිටුව

[10] චාන්ද්‍ර ව්‍යාකරණය, 11 පිටුව

[11] මොග්ගල්ලායන ව්‍යාකරණය, 02 පිටුව

[12] චාන්ද්‍ර ව්‍යාකරණය, 12 පිටුව

[13] මොග්ගල්ලායන ව්‍යාකරණය, 03 පිටුව

[14] චාන්ද්‍ර ව්‍යාකරණය, 44 පිටුව

[15] මොග්ගල්ලායන ව්‍යාකරණය, 18 පිටුව

[16] චාන්ද්‍ර ව්‍යාකරණය, 13 පිටුව

[17] මොග්ගල්ලායන ව්‍යාකරණය, 03 පිටුව

[18] චාන්ද්‍ර ව්‍යාකරණය, 11 පිටුව

[19] මොග්ගල්ලායන ව්‍යාකරණය, 02 පිටුව

[20] චාන්ද්‍ර ව්‍යාකරණය, 11 පිටුව

[21] මොග්ගල්ලායන ව්‍යාකරණය, 02 පිටුව

[22] පඤ්චිකා ප්‍රදීපය,

[23] කාතන්ත්‍රය,

[24] කාතන්ත්‍ර, 85 පිටුව

[25] කච්චායන ව්‍යාකරණය, 59 පිටුව, = වැගම පියරතන හිමි, (සංස්:) කොළඹ 1995

26 කාතන්ත්‍ර, 99 පිටුව

27 කච්චායන ව්‍යාකරණය, 65 පිටුව

28 කාතන්ත්‍ර, 82 පිටුව

29 කච්චායන ව්‍යාකරණය, 57 පිටුව

30 කාතන්ත්‍ර, 102 පිටුව

31 කච්චායන ව්‍යාකරණය, 65 පිටුව

32 කාතන්ත්‍ර, 88 පිටුව

33 කච්චායන ව්‍යාකරණය, 58 පිටුව

34 සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය, 644 පිටුව, සංස්කෘත සාහිත්‍ය, 537 පිටුව

35 Pannini's Grammatik, 56 පිටුව, Bohtlingk Otto, Germany, 1964

36 කච්චායන ව්‍යාකරණය, 59 පිටුව

37 Pannini's Grammatik, 57 පිටුව

38 කච්චායන ව්‍යාකරණය, 59 පිටුව

39 Pannini's Grammatik, 59 පිටුව

40 කච්චායන ව්‍යාකරණය, 58 පිටුව

41 Pannini's Grammatik, 67 පිටුව

42 කච්චායන ව්‍යාකරණය, 63 පිටුව

43 Pannini's Grammatik, 49 පිටුව

44 කච්චායන ව්‍යාකරණය, 65 පිටුව

45 Pannini's Grammatik, 58 පිටුව

46 කච්චායන ව්‍යාකරණය, 58 පිටුව

47 ලඝුශබ්දේන්ද්‍රශේඛර, 431 පිටුව, ගෝපාල ශාස්ත්‍රී, බාරාණාසි 1963 (දේවනාගරාක්ෂර)

48 පදසාධන සන්නය, 06 පිටුව, රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධම්මානන්ද හිමි (සංස්:) 1932

49 කච්චායන ව්‍යාකරණය, 01 පිටුව. වෑගම පියරතන හිමි (සංස්කරණ) 1995, එස්.ගොඩගේ ප්‍රකාශන, මරදාන. ''තෙ ච ඛො අක්ඛරාපි අකාරාදයො එකචත්තාළීසං සුත්තන්තෙසු සොපකාරං තං යථා - අ ආ ඉ උ ඌ එ ඔ ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ අං ඉති අක්ඛරා නාම හොන්ති'' කච්චායනසුත්තනිද්දෙසය, 04 පිටුව. මාබෝපිටියේ මේධංකර හිමි (සංස්:) 1915. කොළඹ.

50 මහාසද්දනීතිප්පකරණ, 02 පිටුව, අරුග්ගොඩ සීලානන්ද හිමි (සංස්කරණ) 1909) තත්ථ ධාතූති, කේනට්ඨේන ධාතු? සකත්ථම්පි ධාරේති, ධාතු අත්ථාතිසයයෝගතෝ පරත්ථම්පි ධාරේති. (පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් අතරින් විශාලතම පාලි ව්‍යාකරණය වන්නේ සද්දනීති ව්‍යාකරණ සම්ප්‍රදායයි. මෙය ලක්දිව රචිත කෘතියක් නොවෙයි. බුරුමයේ රචනා කොට ලංකාවට ගෙනවිත් තිබේ. මෙහි කර්තෘවරයා වන්නේ බුරුමයේ අරිමද්දන නුවර වාසය කළ අග්ගමහා පණ්ඩිත අග්ගවංස නම් තෙර කෙනෙකු බව ග්‍රන්ථාවසානයේ දැක්වේ. ''ඉති සමන්තභද්දස්ස මහාඅග්ගපණ්ඩිතස්ස සන්තිකෙ ගහිතුපජ්ඣෙන තංසිස්සස්ස සමන්තභද්දස්ස අග්ගපණ්ඩිතස්ස භාගිනෙය්‍යන පටිලද්දනාමධෙය්‍යන සුසම්පදායෙනකරණසම්පත්තිජනිතනිරවජ්ජවචනෙන අරිමද්දනපුරවාසිනා අග්ගවංසාචරියෙන කතං සද්දනීතිපකරණං නිට්ඨිතං'' යනුවෙන් කර්තෘවරයාගේ තොරතුරු අන්තර්ගත කොට තිබේ. රචිත කාලය වන්නේ ක්‍රි:ව: 1154 දී ය. මහාපරාක්‍රම රාජ සමය හෙවත් පොළොන්නරු යුගයේ දී මෙම සද්දනීති ව්‍යාකරණය ලංකාවට ගෙනවිත් තිබේ. වත්මනෙහි දක්නට ලැබෙන මහාසද්දනීතිප්පකරණයට ලියූ සන්න දක්නට නොමැත. 1909 අරුග්ගොඩ සීලානන්ද හිමියන්ගේ සංස්කරණය පෙළ පමණක් වෙයි. අපද මේ කාර්යයන් සඳහා භාවිත කරන ලද්දේ එකී සංස්කරණය වෙයි)

51 මහාසද්දනීතිප්පකරණ, 08 පිටුව,

52 මහාසද්දනීතිප්පකරණ, 08 පිටුව,

"පච්චුපන්නස්මිං කාලස්මිං වත්තමානා පවත්තති,
ආසිට්ඨා'ණපනත්ථෙසු පච්චුපන්නම්හි පඤ්චමී.

පච්චුපන්නේන පරිකප්පා'නුමත්‍ය'ත්ථෙසු සත්තමී,
අපච්චක්ඛෙ අතීතම්හි පරොක්ඛා සම්පවත්තති.

හීයොප්පභුති කාලස්මිං අතීතම්හි පවත්ති,
පච්චක්ඛෙ වා අපච්චක්ඛෙ හීයත්තනී නිරුත්තති.

අජ්ජප්පභුති කාලස්මිං අතීතම්හි පවත්තති,
පච්චක්ඛෙ වා අපච්චක්ඛෙ සමීප'ජ්ජතනව්හයා.

53 මහාසද්දනීතිප්පකරණ, 230 පිටුව

54 මහාසද්දනීතිප්පකරණ,

55 මහාසද්දනීතිප්පකරණ, 264 පිටුව

56 කච්චායන ධාතු මඤ්ජුසා, 07 පිටුව

57 පාලි සිංහල ශබ්දකෝෂය, 182 පිටුව, උප+ඉ+පාපනෙ, පැමිණීමෙහි+ණෙ+ති, පැමිණෙයි.

58 මහාසද්දනීතිප්පකරණ, 503 පිටුව

60 මහාසද්දනීතිප්පකරණ, 531 පිටුව. *යත්ථ යස්මා සන්ධිකිච්චං නාමා ලොණධූපනං විය සබ්බබ්‍යඤ්ජනෙසු, සබ්බකම්මික අමච්චො විය සබ්බරාජකිච්චෙසු සබ්බත්ථ ඉච්චිතං හොති.*

61 සිංහල පාලි ශබ්දකෝෂය, 19 පිටුව

63 මහාසද්දනීතිප්පකරණ, 552 පිටුව, *මිස්සිභූතානං සරබ්‍යඤ්ජනා'දීනං සන්ධිවොමිස්සක සන්ධිතථාහි සරබ්‍යඤ්ජනනිග්ගහීතා'දෙසලොපකරණවසෙන සාධිතො සන්ධිවොමිස්සකසන්ධී'ති වුච්චති*

64 මහාසද්දනීතිප්පකරණ, 648 පිටුව

65 මහාසද්දනීතිප්පකරණ, 682 පිටුව

66 මහාසද්දනීතිප්පකරණ, 707 පිටුව

67 මහාසද්දනීතිප්පකරණ, 707 පිටුව, වත්තමානා'දීනං විභත්තීනං යානි යානි පුබ්බාකාර ඡ පදානි? තානි තානි පරස්සපදානි නාම. ති අන්ති සි ථ මි ම

68 මහාසද්දනීතිප්පකරණ, 771 පිටුව, තත්ථ නාමිකපදං ආඛ්‍යාතපදං උපසග්ගපදං නිපාතපදන්ති චත්තාරි වාචෝගධපදානි නාම හොන්ති